# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2441/16 - 2025 ජූනි මස 18 වැනි බදාදා - 2025.06.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක ජී. එල්. 24 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති එයට අනුරූපීව මෙහි II වන උපලේඛනයේ II වන තීරයේ අදාළ කෙටි යෙදුම දක්වා ඇති උපාධියට අදාළ උපාධි පාඨමාලා පවත්වනු ලබන ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ්හි, බලගොල්ල, කෙන්ගල්ල, මහනුවර පිහිටි ශාඛාව (මහනුවර ශාඛාව) මෙම නියමය මගින් පිළිගනු ලැබේ.

### I වන උපලේඛනය

***කොන්දේසි***

1. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනයේ - මහනුවර ශාඛාව, මෙම නියෝගය පළකරන ලද දින සිට නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් (5) අවුරුදු සමාලෝචනයකට යටත්ව, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිවලට අදාළ උපාධි පාඨමාලා පවත්වනු ලබන ආයතනයක් ලෙස පිළිගනු ලැබිය යුතුය.

2. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනයේ - මහනුවර ශාඛාව, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලා, බලගොල්ල කෙන්ගල්ල, මහනුවර යන ස්ථානයේදී පමණක් පැවැත්විය යුතුය.

1A - PG 7156 — 284 (2025/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනයේ - මහනුවර ශාඛාව, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී නිශ්චිත බලධරයා විසින් අනුමත කරනු ලබන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (තොරතුරු තාක්ෂණය) |
| ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව | බීබීඒ ගෞරව |

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 ජූනි මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 06 - 0132

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.